සමගි ජන බලවේගය
ஐக்கிய மக்கள் சக்தி | SAMAGI JANA BALAWEGAYA

2025.09.10

# මාධ්‍ය නිවේදනය

විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම යුගයේ අවශ්‍යතාවයක් වූයේ ආර්ථික සංවර්ධනය, පාරිභෝගික විදුලි අවශ්‍යතාව, ඉල්ලුමට සරිලන විදුලි සැපයුමක් ලබාදීම සඳහා විදුලි ධාරිතාවය වැඩිකිරීම මූලික අරමුණ වේ. එම ක්‍රියාමාර්ග ගැනීම සඳහා පූර්ණ ශක්තියක් රජය තුල නොමැති බැවින් අකාර්යක්ෂමතාවය, නාස්තිය, දූෂණය වළක්වා අඛණ්ඩව විදුලි බලය විනිවිදභාවයෙන් යුක්තව විදුලි ඒකකයට අවම මිලක් තුල ලබාදීමට අදාළ සම්පත් වර්ධනය කිරීමටත්, එම කර්තවයන් සාර්ථකව කර ගැනීම සඳහා විදුලි සේවකයින්ගේ අයිතීන්, වරප්‍රසාද සුරක්ෂිත කිරීමත් පෝෂණය කිරීමත් අරමුණ විය.

අප දැනුවත් වී ඇති පරිදි සමස්ත විදුලි සේවකයින් ප්‍රතිව්‍යුහගතකරණයට කිසිදු විරෝධයක් දක්වා නොමැති වුවද අනුමත ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවභාවිතා කරමින් සිදුවන ක්‍රියාවන් සේවකයින් මෙතෙක් ලැබූ අයිතීන්, වරප්‍රසාද සහ දීමනා ලබාගැනීම පිළිබඳව විදුලිබල අමාත්‍යවරයා සමඟ පැවති වෘත්තීය සමිති සාකච්ඡාවලදී වාචිකව එකඟ වී එනමුත් එම කරුණු ඉටු නොවීම මත එම ඉල්ලීම් ලබාගැනීම සඳහා බලශක්ති අමාත්‍යවරයා වෙත ලිඛිතව දන්වා දින ගණනක සිට ක්‍රියාත්මක වන අකුරට වැඩ කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කොට ඇතත් පාලක පක්ෂය අදාළ ගැටළු නිරාකරණය කිරීමට මෙතෙක් වෘත්තීය සමිති සමඟ සාකච්ඡාවක් හෝ මැදිහත් වීමක් ලබා නොදීම මත අකුරට වැඩ කිරීමේ ක්‍රියාවලිය විදුලි වැඩ වර්ජනයක් දක්වා ගමන් කරන බව වෘත්තීය සමිති ප්‍රසිද්ධියේ ප්‍රකාශ කොට ඇත.

විදුලි පාරිභෝගිකයින් ඇතුළු සමස්ත ජනතාව දැඩි ආර්ථික සහ සමාජීය පීඩනයකට ලක්වී සිටින බැවින් විදුලි සේවකයින්ගේ අකුරට වැඩ කිරීමේ ක්‍රියාවලිය වැඩ වර්ජනයක් දක්වා ගෙන යාමට ඉඩ දීම තුළින් පීඩාවට පත්වී සිටින සමස්ත ජනයා යළි දැඩි පීඩනයකට ලක්වන බැවින් ප්‍රතිව්‍යුහගතකරණයට එකඟ එනමුත් ලිපියේ සඳහන් කරුණු ඉටු කිරීම සඳහා රජය අදාළ මැදිහත්වීමක් සිදුනොවීම තුළින් දැඩි සමාජමය ගැටළුවක් ඇති වන බැවින් අදාළ ඉල්ලීම් සහ යෝජනා ඉටු කිරීම සඳහා කඩිනම් ස්ථිර සාකච්ඡාවක් සහ ක්‍රියාමාර්ගයක් අකුරට වැඩ කිරීමේ නියැලි සිටින වෘත්තිය සමිති සමඟ සාකච්ඡා කොට ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ අරමුණු සාර්ථක කරගැනීම සඳහාත් ජනතාව දැඩි පීඩනයකට ලක්නොවීම සඳහාත් අකුරට වැඩ කිරීමේ ක්‍රියාවලිය නවතාලීම සඳහා රජයේ පූර්ණ මැදිහත් වීම ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි.

මාධ්‍ය අංශය
සමගි ජන බලවේගය

සමගි ජන බලවේගය, නො. 592, බංගලා හන්දිය, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.
ஐக்கிய மக்கள் சக்தி, இல. 592, பங்களா சந்தி, கோட்டே வீதி, பிடகோட்டே.
Samagi Jana Balawegaya, No. 592, Bangala Junction, Kotte Road, Pitakotte.
+94 11 287 0211 / +94 11287 0212 +94 11287 8440 generalsecretarysjb@gmail.com

Activate Windows